ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය - **2019**

-----------------------------------------------

## 1.1 තත්ත්වාගණනය කළ මතය

------------------------------

ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ "විශ්වවිද්‍යාලය" 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර ආයතනයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-----------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

----------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විශ්වවිද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

------------------

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

--------------------------------------------------------------

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරිබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් විශ්වවිද්‍යාලය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූල නොවීම

----------------------------------------------------------------------

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 50 වන වගන්තිය ප්‍රකාරව, දේපල, පිරියත සහ උපකරණ යනු ආයතනයක මෙහෙයුම් කටයුතුවලදී ස්වභාවයෙන් හෝ ක්‍රියාකාරීත්වයෙන් සමාන වත්කම් සමූහයකි. කෙසේ වෙතත්, රු.263,439,263 ක් වටිනා දුරකථන, VIOP දත්ත ජාල, විදුලිය, කබා, අභ්‍යන්තර මාර්ග සහ ජල සැපයුම් යනාදිය සමාන සවභාවයේ වත්කම් හෝ ක්‍රියාකාරීත්වය අනුව වෙනම පන්ති ලෙස දැක්වීම වෙනුවට අනෙකුත් වත්කම් යටතේ දක්වා තිබුණි. | මාර්ග හා විදුලි සම්ප්‍රේෂණ ජාල, ආදිය දේපල, පිරියත සහ උපකරණ යටතේ වෙනම පන්තියක් ලෙස පිළිවෙලින් "මාර්ග" සහ "විදුලි සම්ප්‍රේෂණ ජාල" ලෙස පෙන්වීමට පියවර ගනු ලැබේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ii) දේපල, පිරියත සහ උපකරණ යටතේ දක්වා තිබූ සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද අයිතම 5ක් ශ්‍රී කා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 65 වන වගන්තිය ප්‍රකාරව ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කර නොතිබුණි. එම වත්කම් වල මුළු පිරිවැය රු.721,793,649 ක් විය. | ප්‍රත්‍යාගණනය අවසන් කිරීමෙන් පසු, සභාවේ අනුමැතිය ඇතිව ප්‍රත්‍යාගණන වටිනාකම 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කරනු ලැබේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (i) මූල්‍ය ප්‍රකාශන වල දේපළ, පිරියත හා උපකරණ යටතේ සමාලෝචිත වර්ෂය අවසානයේ අස්පෘෂ්‍ය ස්වභාවයේ රු.52,248,610 ක්වූ වත්කම් සඳහා ක්‍රමක්ෂය ප්‍රතිපත්තිය හඳුනාගෙන නොතිබුණි. | ස්ථාවර නොවන වත්කම් යටතේ අවසාන වර්ෂයේ ව්‍යාපෘති තනි තනිව පෙන්වනු ලැබේ. අස්පෘශ්‍ය වත්කම් යටතේ ඒවා වෙන වෙනම පෙන්වීමට පියවර ගනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් අස්පෘශ්‍ය ස්වභාවටය් වත්කම් සඳහා ක්‍රමක්ෂය කිරීමේ ප්‍රතිපත්තිය හඳුනා ගැනීමට පියවර ගත යුතුය. |
| (ii) සමාලෝචිත වර්ෂය අවසානයට විශ්වවිද්‍යාලය සතු රු.194,411,091 ක් පිරිවැය වූ අභ්‍යන්තර මාර්ග ගොඩනැගිලි හා අනෙකුත් වත්කම් වල ඇතුලත් කර තිබුණි. කෙසේවෙතත්, අභ්‍යන්තර මාර්ග සඳහා වන ක්ෂය ප්‍රතිපත්තිය හඳුනා ගැනීමකින් තොරව සියයට 5 හා සියයට 20 ලෙස ක්ෂය කර තිබුණි. | දේපළ, පිරියත හා උපකරණ යටතේ "මාර්ග" ලෙස වෙනමම පංතියක් ලෙස මාර්ග දැක්වීමට කටයුතු කරන අතර ඒ සඳහා වන ක්ෂයද ගිණුම්කරණ ප්‍රතිපත්තිය අනුව ගැලපීමට කටයුතු කරනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් අභ්‍යන්තර මාර්ග ක්ෂය කිරීමේ ප්‍රතිපත්තිය හඳුනා ගැනීමට පියවර ගත යුතුය. |

### 1.5.3 නොසැසඳුනු පාලන ගිණුම් හා සටහන්

| 2019 දෙසැම්බර් 31 දිනට වන අයිතමය | මූල්‍ය ප්‍රකාශන අනුව | භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තා අනුව | වෙනස | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | | |
| ලී බඩු කාර්යාල | 502,887,595 | 501,957,942 | 929,653 | වෙනස්කම් සැසඳීමට දැනටමත් පියවර ගෙන තිබේ. මෙම සැසඳීම් හේතුකොටගෙන නොසැසඳූ අගය පසුගිය වසරට සාපේක්ෂව සැලකිය යුතු ප්‍රමාණයකින් අඩු වී තිබුණි. | පාලන ගිණුම්වල දැක්වෙන වෙනස්කම් සැසඳීමට කටයුතු කළ යුතුය. |
| උපකරණ | 599,166,094 | 93,406,932 | 5,759,162 | | |
| | | | 6,688,815 | | |

## 1.6 ලැබිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එක් ණය ශේෂයක්, මහපොළ ශිෂ්‍යත්ව අත්තිකාරමක්, බැඳුම්කර උල්ලංඝනයන් 02 ක් සහ කොන්ත්‍රාත්කරුවන් හා ආයතන 13 ක් ආදීන්ගෙන් 2019 දෙසැම්බර් 31 වන විට ලැබිය යුතු රු.1,783,077 ක් වසර 02 සිට 18 දක්වා කාලයක් අයකර ගැනීමකින් තොරව හිඟ ලෙස දක්වා තිබුණි. | අයවිය යුතු මුළු මුදල අයකර ගැනීමට, නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට, විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලින් අයකර ගැනීමට සහ අයකර ගැනීමේ ස්වභාවය අනුව කපා හැරීමට පියවර ගෙන තිබේ. | ලැබිය යුත හිඟ ප්‍රමාණය ප්‍රමාදයකින් තොරව අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 102, 103 හා 104 සහ ජාතික පුස්තකාල ලේඛන සේවා මණ්ඩලයේ 2016 දෙසැම්බර් 22 දින සංශෝධනය කළ අංක 2004/එල්ඩී/1 දරන චක්‍රලේඛය | 2017 වර්ෂය සඳහා පවත්වනු ලැබූ පුස්තකාල පොත් තොග සත්‍යාපන වාර්තාව අනුව, රු.303,491 ක් වටිනා පොත් 473 ක් අස්ථාන ගත වී තිබුණි. මේ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මෙම පොත් නැතිවීමට හේතුවූ කරුණු සෙවීමට විශ්වවිද්‍යාලය විසින් පියවර ගනු ලැබේ. තවද, වගකිවයුතු පුද්ගලයා / පුද්ගලයින් ඇත්නම් වගකීම පැවරීමට සහ / හෝ අනාගතයේදී වැළැක්වීමේ පියවර ගැනීමට කටයුතු කරනු ඇත. | මුදල් රෙගුලාසි සහ පුස්තකාල ලේඛන සේවා මණ්ඩල චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා උසස් අධ්‍යාපන ආයතන සඳහා වන ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 02 වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වගන්තිය | විවිධ අරමුදල් ගිණුම්වල ඇති රු. 35,284,825 ක මුදල්, මුදල් අමාත්‍යාංශයේ සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ එකඟතාවයකින් තොරව 2019 දෙසැම්බර් 31 දින වන විට ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි. | අනාගතයේදී ස්ථාවර තැන්පතුවල තැන්පත් කිරීමේදී මුදල් අමාත්‍යාංශයේ සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ එකඟතාවය ලබා ගැනීමට පියවර ගනු ලැබේ. | උසස් අධ්‍යාපන ආයතන සඳහා වන ආයතන සංග්‍රහයේ හා මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ)විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හා උසස් අධ්‍යාපන ආයතන සඳහා වන ආයතන සංග්‍රහයේ XXVI වන පරිච්ඡේදයේ 3 හා 4 වගන්ති | (i)2018 වර්ෂය සඳහා පවත්වන ලද වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය විසින් අයිතම 1073 ක් විකිණීම සඳහාද අයිතම 418 ක් විනාශ කිරීම සඳහාද නිර්දේශ කර තිබුණි. කෙසේවෙතත්, මෙම වාර්තාවේ දිනය | මෙම ක්‍රියාකාරකමට ක්‍රියාදාමයන් ගණනාවක් ඇති අතර අවශ්‍ය සියලු ක්‍රියාමාර්ග සම්පූර්ණ කර ඇති අතර සභාව විසින් අවශ්‍ය කටයුතු සිදු කිරීමට වාර්තාව සඳහා අනුමැතිය ලබා දී ඇත. එබැවින් මෙම භාණ්ඩ විකිණීම හා විනාශ | තවදුරටත් ප්‍රමාදයකින් තොරව, උසස් අධ්‍යාපන ආයතනවලට අදාල ආයතන සංග්‍රහය අනුව පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | දක්වාම මේ සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | කිරීම නියමිත වේලාවට සිදු කරනු ලැබේ. | |
| | (ii) තවද, 2012 සිට 2017 දක්වා කාලය තුළ පවත්වන ලද පුස්තකාල පොත් සඳහා තොග සත්‍යාපනය පිළිබඳ වාර්තාව විසින් යෝජනා කරන ලද ක්‍රියාමාර්ග මේ දක්වා සිදු කර නොතිබුණි. | සෙනෙට් සභාවේ අනුකමිටුවක් වන පුස්තකාල කමිටුව සාකච්ඡාවක් සඳහා **"**තොග සත්‍යාපනය වාර්තාව**"** භාරගෙන ඇති අතර හානියට පත් අයිතම 1278 ක් කපා හැරීමටත් **"**විශ්ව විද්‍යාල පුස්තකාලවල තොග සත්‍යාපන ක්‍රියාපටිපාටිය පිළිබඳ ප්‍රතිපත්තිය**"** පිළිබඳ ලේඛනයක් සකස් කිරීමටත් නිර්දේශ කර තිබේ. එබැවින්**,** අස්ථානගත වූ අයිතම පිළිබඳව තීරණයක් ගැනීමට එම ප්‍රතිපත්තිය ලැබෙන තෙක් විශ්වවිද්‍යාලය බලා සිටී. | පුස්තකාල කමිටුවේ නිර්දේශය අනුව පුස්තකාල පොත් සඳහා තොග සත්‍යාපන වාර්තාව සම්බන්ධයෙන් පියවර ගත යුතුය. |
| (ඈ)අංක IAI/2002/02 හා 2002 නොවැම්බර් 28 දිනැති භාණ්ඩාගාර චක්‍රෙල්ඛය | 2019 දෙසැම්බර් 31 දින වන විට රු.228,235,039 ක පිරිවැයක් සහිත පරිගණක හා පරිගණක උපාංග සටහන් කිරීම සඳහා ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. | පරිගණක හා උපාංග සඳහා ස්ථාවර වත්කම් ලේඛනයක් සකස් කිරීම සිදු වෙමින් පවතින අතර ලේඛනයෙන් 92% කට වඩා වැඩි ප්‍රමාණයක් සකස් කර අවසන් අතර 2020 ජූලි මස අවසන් වන විට එය අවසන් කිරීමට අපේක්ෂා කෙරේ. | IAI / 2002/02 භාණ්ඩාගාර චක්‍රලේඛය අනුව පියවර ගත යුතුය. |
| (ඉ)විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අංක 10/2017 හා 2017 ජූලි 10 දිනැති චක්‍රලේඛය | කාර්යමණ්ඩලයේ සියලුම දෙනා තම පැමිණීම හා පිටවීම සටහන් කිරීම සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍රය භාවිතා කළ යුතු වේ. කෙසේ වෙතත්, අධ්‍යන කාර්යමණ්ඩලය ඒ අනුව කටයුතු කර නොතිබුණි. | ශ්‍රී ලංකාවේ රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතිය තුළ පොදු සිරිතක් ලෙස**,** අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පැමිණීම හා පිටවීම පවත්වාගෙන යනු නොලැබේ. | විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 10/2017 චක්‍රලේඛය ප්‍රකාරව පැමිණීම් සහ පිටවීම් සලකුණු කිරීමට පියවර ගත යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.229,656,231 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.45,226,543 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.184,429,688 ක ඌණතාවයක් නිරීක්ෂණය විය. මෙම ඌණතාවයට සමාලෝචිත වර්ෂය තුල පුද්ගල පඩිනඩි හා පාරිතෝෂික පිළිවෙලින් රු.258,058,056 කින් හා රු.161,669,219 කින් වැඩිවීම හේතු වී තිබුණි.

**2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය**

සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන ප්‍රදාන හා වෙනත් ආදායම් වැනි විශ්වවිද්‍යාලයේ ආදායම ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සියයට 23 කින් ඉහළ යාමක් නිරීක්ෂණය වූ අතර සමාලෝචිත වර්ෂයේ මහපොළ හා ශිෂ්‍යාධාර ප්‍රදාන ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සියයට 56 කින් පහළ යාමක් නිරීක්ෂණය විය.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) කථිකාචාර්යවරයකුගේ ගිවිසුම් කඩ කිරීමේ බැඳුම්කර වටිනාකම අයකර ගැනීමට පියවර ගැනීම සඳහා වගකිවයුතු නිලධාරීන්ගේ නොසැලකිල්ල හේතුවෙන් වසර හයකට වැඩි කාලයක් ප්‍රමාද වීම නිසා විශ්වවිද්‍යාලයට රුපියල් මිලියන 1.73 ක අලාභයක් සිදුවී තිබුණි. කෙසේ වෙතත්, එම නිලධාරීන්ට විරුද්ධව කිසිදු පියවරක් මේ දක්වා ගෙන නොතිබුණි. | සභාවේ 231 වන රැස්වීමේදී මතු කළ අදහස වූයේ, 2000/12/06 දින සිට 2010/07/13 දින දක්වා අධ්‍යයන ආයතන භාරව සිටි නිලධාරීන් මෙම අලාභය සම්බන්ධයෙන් වගකිවයුතු ලෙස රාජකාරි ඉටු කර නොමැති බවයි. අලාභ පියවා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා සභා තීරණය දැනටමත් අධ්‍යයන ආයතන අංශයට දැනුම් දී ඇත. | වගකිව යුතු නිලධාරීන්ගෙන් අදාල අලාභ අයකර ගැනීමට පියවර ගත යුතුය. |
| (ආ) 1999 සිට 2008 දක්වා කාලය තුළ විශ්ව විද්‍යාලයේ තාවකාලික / දෛනික වැටුප් පදනම මත කුලියට ගත් සේවකයින් 28 දෙනෙකු සඳහා වන සේවක අර්ථ සාධක අරමුදල් ගෙවීම් 1958 අංක 15 දරණ සේවක අර්ථසාධක අරමුදල් පනත (සංශෝධිත) ප්‍රකාරව සිදු කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, ඉහත පනතේ 16 (ඊ) වගන්තිය ප්‍රකාරව 2018 සහ 2019 වර්ෂවල නියමිත දිනට දායක මුදල් ගෙවීමට අපොහොසත් වීම හේතුවෙන් විශ්වවිද්‍යාලය රු.1,215,442 ක මුදලක් අධිභාර ලෙස ගෙවා තිබුණි. තවද, එකතුව රු. 1,022,380 ක් වූ සේවක දායකත්වය සේවකයින්ගේ ඉපැයීම්වලින් අඩු | විශ්වවිද්‍යාලය විසින් ගෙවනු ලබන සේවක දායකත්වය ඔවුන්ගේ වැටුපෙන් හෝ වෙනත් ආකාරයකින් අයකර ගැනීමට අදාළ සේවකයින්ගෙන් කැමැත්ත ලබා ගැනීමට අවශ්‍ය පියවර ගැනීමට තීරණය කරන ලදී. | අදාළ සේවකයින්ගෙන් හෝ වගකිවයුතු නිලධාරීන්ගෙන් සේවක දායක මුදල් අයකර ගැනීමට පියවර ගත යුතුය. |

නොකර විශ්වවිද්‍යාල අරමුදලින් ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන්, එම ගෙවීමට වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව පියවර ගෙන නොතිබුණි.

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) බාහිර උපාධි ශිෂ්‍ය අත්පොතට අනුව, උපාධි පාඨමාලා සම්පූර්ණ කිරීමේ අවම කාල සීමාව අධ්‍යයන වර්ෂ 03 කි. කෙසේ වෙතත්, BA, BBA සහ B.com සඳහා වන බාහිර උපාධි පාඨමාලා සිසුන්ට නිසි පරිදි සම්පූර්ණ කිරීමට අවසන් කණ්ඩායම් තුන සඳහා වසර 5 කට වැඩි කාලයක් ගත වී තිබුණි. | පාඨමාලා අත්පොත් ලබා දීම ප්‍රමාද වීම, නියමිත වේලාවට ප්‍රතිඵල නිකුත් කිරීම ප්‍රමාද වීම සහ විවිධ හේතු නිසා විශ්ව විද්‍යාලය වසා දැමීම වැනි හේතූන් නිසා උපාධිය සම්පූර්ණ කිරීමේ කාලය දීර්ඝ කිරීමට සිදුවේ. පාඨමාලා අත්පොත් දැන් ලබා ගත හැකි බැවින්, අනාගතයේදී ප්‍රමාදයන් අවම කර ගත හැකි වේ. | ශිෂ්‍ය මාර්ගෝපදේශන පොත අනුව උපාධි පාඨ මාලාව නියමිත කාල සීමාව තුළ සම්පූර්ණ කිරීමට පියවර ගත යුතුය. |
| (ආ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මිණුම් දඬු අනුව, කලා හා සංස්කෘතිය, කළමනාකරණය සහ වාණිජ හා ඉස්ලාමීය අධ්‍යයන හා අරාබි භාෂා පීඨ සඳහා උපාධි අපේක්ෂකයින් : ස්ථිර අධ්‍යන කාර්ය මණ්ඩල අනුපාතය 18: 1 ක් ලෙස සහ ව්‍යවහාරික විද්‍යා, ඉන්ජිනේරු හා තාක්ෂණ පීඨ සම්බන්ධයෙන් එය 10:1 ක් ලෙස පවත්වා ගත යුතුය. කෙසේ වෙතත්, ඉහත මිණුම් දණ්ඩට පටහැනිව විශ්ව විද්‍යාලය ඉහත අනුපාතය 20:1 සිට 53: 1 දක්වා පරාසයක පවත්වා ගෙන ගොස් තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස ඉගැන්වීම හා ඉගෙනීම ආවරණය කිරීම ප්‍රමාණවත් ලෙස ඉටු කිරීමට නොහැකි වී තිබුණි. | 2019 ජුනි මසට අදාල ප්‍රමිතිය මත පදනම්ව තවත් සේවක සංඛ්‍යාවක් ඉල්ලා සිටීමට පියවර ගන්නා ලදී. මෙම කාර්ය මණ්ඩල ඉල්ලීම් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිර්දේශ කර අවශ්‍ය ක්‍රියාමාර්ග සඳහා ඔවුන් වෙත ඉදිරිපත් කර තිබුණද, මේ දක්වා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් තවමත් අනුමත කර නොමැත. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් නව සේවක පුරප්පාඩු අනුමත කිරීමෙන් පසු එම සේවක පුරප්පාඩු පිරවීමට පියවර ගනු ලැබේ. | සේවක පුරප්පාඩු පිරවීම සඳහා කාර්ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට පියවර ගත යුතුය. |

**3.3 නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත දේපළ, පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) ව්‍යවහාරික විද්‍යා පීඨය සඳහා රසායනාගාරයක් ඉදිකිරීමේ කටයුතු 2014 පෙබරවාරි 15 වන දින අවසන් කර ඇති අතර, රු.84,156,395 ක පිරිවැයක් දරා ඇති අතර එයට විදුලි උපකරණ සඳහා රු.1,856,467 ක්ද 2016 දී වැය කර තිබුණි. කෙසේ වෙතත්, | දැනට, සියළුම රසායනාගාර සඳහා රසායනාගාර ගෘහ භාණ්ඩ සපයා සවි කර ඇති අතර ඇණවුම් කරන ලද උපකරණවලින් 70% කට වඩා සපයා තිබුණි. මෙම ගොඩනැගිල්ල, සැලසුම් හා ඉදිකිරීම් අවධියේදී, රසායනාගාර සඳහා අවශ්‍ය ජලාපවහනය, ගෑස් සහ ජල නල වැනි පහසුකම් සැපයීම සඳහා සැලසුම් කර නොතිබුණි. පවත්නා ගොඩනැගිල්ලකට මේවා ස්ථාපනය කිරීම ඉතා | තවදුරටත් ප්‍රමාදයකින් තොරව රසායනාගාර කොටස භාවිතා කිරීමට පියවර ගත යුතුය. |

| | | |
|---|---|---|
| රසායනාගාරය මේ දක්වා අපේක්ෂිත අරමුණු සඳහා යොදා ගෙන නොතිබූ අතර අවශ්‍ය රසායනාගාර උපකරණ මිලදී ගැනීම ප්‍රමාද වීම හේතුවෙන් වසර 4 කට වැඩි කාලයක් නිශ්ක්‍රීයව පැවතුණි. | පරිස්සමින් කළ යුතු අතර ප්‍රමාණවත් ආරක්ෂක පියවරයන් ගැනීම සඳහා නිසි සැලසුම් රාශියක් අවශ්‍ය වේ. මෙම පහසුකම් සැපයීම සඳහා පියවර ගනිමින් සිටී. | |
| (ආ) සුපිරි වෙළඳසැල් ගොඩනැගිල්ල ඉදිකිරීම 2016 ඔක්තෝබර් 14 වන දින ආරම්භ කර ඇති අතර එය රු.මිලියන 13.33 ක වියදමක් දරා 2018 නොවැම්බර් 29 වන දින නිම කර තිබුණි. කෙසේ වෙතත්, මෙම සුපිරි වෙළෙඳසැල් ගොඩනැගිල්ල මාස 19 ක් පුරා අදාල අරමුණ වෙනුවෙන් භාවිතා කර නොතිබුණි. | IESL පිළිගැනීම සඳහා ඉංජිනේරු සභාවට ඉඩකඩ ඇති බව සනාථ කිරීම සඳහා යාන්ත්‍රික ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ භාවිතය වෙනුවෙන් ඔවුන්ගේ හදිසි හා වැදගත් ඉල්ලීම මත පදනම්ව මෙම ගොඩනැගිල්ල ඉංජිනේරු පීඨයේ වැඩමුළුවට භාර දීමට එකඟ විය. | සුපිරි වෙළඳසැල් ගොඩනැගිල්ල තවදුරටත් ප්‍රමාදයකින් තොරව භාවිතා කිරීමට පියවර ගත යුතුය. |
| (ඇ) 2013 සිට 2017 දක්වා කාලය තුළ මිලදී ගත් රු. 702,987 ක් වටිනා ටයර් සහ ටියුබ් 59 ක් භාවිතා කිරීමකින් තොරව වසර 3 කට වැඩි කාලයක් රඳවා ගෙන තිබුණි. | මෙම ටයර් සහ ටියුබ් මිලදී ගැනීම සඳහා සෘජුව හෝ වක්‍රව සම්බන්ධ වූ අදාළ නිලධාරීන්ට ලිඛිත අනතුරු ඇඟවීමක් කරන ලෙසද මෙම ටයර් සහ ටියුබ් වෙන්දේසියෙන් පසු කිසියම් අලාභයක් සිදුවුවහොත් ඒවා ඔවුන්ට අධිභාර කරන ලෙසද විගණන හා කළමනාකරණ කමිටුවේ සභාපති උපදෙස් දෙන ලදී. | විගණන හා කළමනාකරණ කමිටුවේ සභාපතිගේ තීරණය ක්‍රියාත්මක කිරීමට පියවර ගත යුතුය. |
| (ඈ)ප්‍රධාන පුස්තකාල ගොඩනැගිල්ලේ, පුටු හා උපකරණ 80 ක් සහිත ශ්‍රී ලංකා විශේෂිත ප්‍රකාශන අංශය සහ සම්මන්ත්‍රණ අංශය, වායුසමීකරණ යන්ත්‍ර සවි නොකිරීම හේතුවෙන් වසර 02 කට අධික කාලයක් තිස්සේ නිශ්ක්‍රීයව පැවතුණි. | විශ්ව විද්‍යාලය මේ වන විටත් ‘‘වායුසමීකරණ’’ මිලදී ගැනීම සඳහා මිලදී ගැනීමේ ඉල්ලීම් සටහන් සකස් කර ඇති අතර ප්‍රසම්පාදන ඉදිරි කටයුතු සඳහා අරමුදල් ලැබෙන තුරු සිටී. | වත්කම් උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |

**3.4 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)කළමනාකරණ හා වාණිජ පීඨයට ගොඩනැගිලි සංකීර්ණයක් ඉදිකිරීම සඳහා 2010 දී විශ්වවිද්‍යාලය විසින් කොන්ත්‍රාත්තුවක් ලබා දී ඇති අතර එහි වටිනාකම රුපියල් මිලියන 112 ක් වන අතර එය 2014 පෙබරවාරි 28 වන දිනට පෙර හෝ ඊට පෙර නිම කළ යුතුව තිබුණි. 2014 අප්‍රේල් 20 වන දින ඉදිකිරීම් කටයුතු අවසන් කර තිබුණද, ගිවිසුමට අනුව රු.2,977,412 ක් වූ ප්‍රමාද ගාස්තු කොන්ත්‍රාත්කරුගෙන් මේ දක්වා අය කර ගෙන නොතිබුණි. | රඳවා ගත් මුදල් වලින් අදාල ප්‍රමාද ගාස්තු අඩුකිරීමට මේ වන විටත් විශ්වවිද්‍යාලය මගින් අවශ්‍ය පියවර ගෙන තිබේ. තවද, තවදුරටත් පියවීමට ඇති රු.168,532 ක මුදල හැකි ඉක්මනින් පියවීමට කටයුතු කරන ලෙස විශ්වවිද්‍යාලය මගින් කොන්ත්‍රාත්කරු දැනුවත් කර තිබේ. නියමිත කාලය තුළ අදාල මුදල පියවීමට අපොහොසත් | ප්‍රමාද ගාස්තු අයකිරීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| | වන්නේ නම්, විශ්වවිද්‍යාල මගින් අදාල කොන්ත්‍රාත්කරුට විරුද්ධව නීතිමය ක්‍රියාමාර්ග ගනු ලැබේ. | |
| (ආ) කොන්ත්‍රාත් ගිවිසුමේ කොන්දේසි වල 13.7 වගන්තියට පටහැනිව ගොඩනැගිලි සංකීර්ණය ඉදිකිරීමේදී මූලික අයිතම සඳහා වෙනස් කළ නොහැකි අංග සඳහා විශ්වවිද්‍යාලය විසින් කොන්ත්‍රාත්කරුට රු.2,495,837 ක මුදලක් ගෙවා තිබුණි. තවද, එකතු කළ අගය මත බද්ද හැර මුළු කොන්ත්‍රාත් මිලෙන් සියයට 5.25 ක අනුපාතයකින් උපදේශක ගාස්තුව ගෙවිය යුතුය. කෙසේ වෙතත්, විශ්වවිද්‍යාලය මෙම ගාස්තුව වෙනස් අනුපාත දෙකක් භාවිතා කරමින් ගණනය කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස රු.659,138 ක මුදලක් උපදේශකවරයාට වැඩිපුර ගෙවා තිබුණි. | උපදේශකවරයාගේ නිර්දේශය මත පදනම්ව ගෙවීම් සිදු කරන ලදී. උපදේශන ගාස්තු ගෙවීම ගිවිසුම් ප්‍රකාරව සිදු කරන ලදී. | කොන්ත්‍රාත්කරුවන්ට හා උපදේශකවරුන්ට ගෙවීම් කිරීම සඳහා විධිමත් ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) තාක්‍ෂණ පීඨයේ මල්වත්ත ගොවිපල වෙත 2019 මාර්තු 25 දින එකතු කළ අගය මත බදු රහිතව රු. 14,995,485 ක වියදමින් අභ්‍යන්තර මාර්ගයක් ඉදිකර තිබුණි. මෙහිදී, ඉංජිනේරු ඇස්තමේන්තුගත මුදලට වඩා සියයට 15 කින් අඩු වීම නිසා 1, 2 සහ 3 යන අඩුම මිල ගණන් ඉදිරිපත් කර ඇති ලංසුකරුවන් තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ප්‍රතික්ෂේප කර තිබුණි. කෙසේ වෙතත්, ප්‍රසම්පාදන අත්පොතේ 7.9.2 (ක) උප පරිච්ඡේදය ප්‍රකාරව ඉංජිනේරු ඇස්තමේන්තු සහ වර්තමාන වෙළඳපල තත්ත්වය සමාලෝචනය කිරීම සඳහා මෙම විෂමතාවයට හේතු විශ්ලේෂණය කර නොතිබුණි. මේ හේතුවෙන්, කොන්ත්‍රාත්තුවේ අඩුම ලංසු මුදලට වඩා රු.1,443,195 ක් වැඩි අගයකට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි. | ඉදිරියේදී, වර්තමාන වෙළඳපල තත්ත්වයන් සමඟ ඉංජිනේරු ඇස්තමේන්තු විශ්ලේෂණය කර සමාලෝචනය කිරීමට පියවර ගනු ලැබේ. | ඉදිරියේදී, වර්තමාන වෙළඳපල තත්ත්වයන් සමඟ ඉංජිනේරු ඇස්තමේන්තු විශ්ලේෂණය කර සමාලෝචනය කිරීමට පියවර ගත යුතුය. |